# දේශපාලනයේ මෙතෙක් කතාව

දිවයින
2006 ජූලි මස 31 වැනිද සඳුද




56 ගමනක කතාව — 20 වැනි කොටස

## සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගය රට වෙනුවෙන්...


එල් එච් මෙත්තානන්ද

**1955** අවුරුද්ද රටේ කලබලකාරී කාලයක් විය. විවිධ හා ඇතැම් විට ප්‍රතිවිරුද්ධ දේශපාලන මත වේදිකාවට පැමිණ ප්‍රසිද්ධියේ ගැටෙන අවස්ථා පවා තිබිණ. හූ කීම්, ගල් ගැසීම් නිතර සිදු විය. සභා කඩාකප්පල් කිරීම සාමාන්‍ය දෙයක් විය. මේ පසුබිම තිබෙද්දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් අමතා දේශනයක් කරන මෙන් එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාට කොළඹ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ ආරාධනා කළහ. භෞතික විද්‍යා ශ්‍රවණාගාරයෙහි පැවැත්වූ ඒ දේශනය පටන් ගත් මොහොතේ පටන්ම හූ කීම් හා බාධා කිරීම් සහිත විය. දෙවතාවක්ම කථිකයා දේශනය අතහර දමා යන්නට සූදානම් වූ නමුත් අපි අමාරුවෙන් ඔහු නවතා ගතිමු. දේශනය අවසානයේ ප්‍රශ්න මිටි ආ කල්හි "ඉන්දියානු ප්‍රශ්නය ගැන ඔබේ විසඳුම කුමක්ද?" කියා කෙනෙක් ඇසුවේය. ඒ ඇසුවේ දෙමළ ශිෂ්‍යයෙකි. බණ්ඩාරනායක මහතා ගේ ඉතා කෙටි හා අවිනිශ්චිත පිළිතුර වූයේ "ඉලන්දාරියා මා කෙරෙහි විශ්වාසය තබන්න" යැයි කීම පමණකි. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ඉදිරියට පැමිණ මෙවැනි විහිළු පිළිතුරක් දුන් කෙනෙකුට ලැබෙන කටුක සංග්‍රහය දේශකයාට අමතක නොවන අත්දැකීමක් වනු නොඅනුමානය. දේශක ඊට ඔරොත්තු දුන්නේය.

මේ සිද්ධිය පසු වී වැඩි කාලයක් යන්නට පෙර, විශ්වවිද්‍යාලයේ අවසන් නිරීක්ෂණ ඉවර වූයෙන් ඒ වර්ෂයේ කණ්ඩායම විසිර යෑමේ අවස්ථාව ළං විය. ඊට පෙර ශිෂ්‍ය ශිෂ්‍යාවන් සියලුදෙනා එකතු වී බස් දෙකක් ගෙන චාරිකාවක් සංවිධානය කරන ලදී. එහි පළමු වැනි පියවර වූයේ හොරගොල්ලේ පිහිටි බණ්ඩාරනායක නිවසට යෑමයි. බණ්ඩාරනායක මහතාට කලින් කියා දිනයක් හා වේලාව වෙන් කොටගත් අපි නියමිත වේලාවට එහි ගියෙමු. බණ්ඩාරනායක මහතා අප සියලුදෙනා එන තෙක් එහි බලා සිටියේය. අප කණ්ඩායම ඉතා සුහදව පිළිගත් ඔහු තමන්ට වැදගත් රැස්වීමකට යෑමට තිබෙන හෙයින් වහාම එහි යන බව පවසා මුළු ගෙය අප කැමති අන්දමකට පරිහරණය කරන්නැයි ද අවශ්‍ය වේලාවක් රැඳී සිටින්නැයිද කියා ගෙය අපට භාරදී පිටත් විය. අපි වහාම ඔහු ඔසවාගෙන හී ඉස් අ ජොලි ගුඩ් ෆෙලෝ කියා උඩ දමා බිම තැබුවෙමු.

හොරගොල්ලේ නිවසට ඇතුළු වන තැන විශාල බරාඳයක් තිබේ. එය මීටර් 10 ක් පමණ දිගය. එහි කෙළවර උඩු මහලට නගින පඩි පෙළ තිබේ. පඩි පෙළ දෙපැත්තෙහි දැවැන්ත කණ්නාඩි දෙකක් සවි කොට ඇති හෙයින් ගෙය දෙගුණයක් දික් වී පෙනේ. පඩි පෙළ අසල පුළුන් පුරවා සාදන ලද විශාල කේසර සිංහයෙකි. විසිත්ත බඩු හා ඡායාරූප ආදියෙන් බරාඳය අලංකෘතය. කිසිවකු නැති පාළු ගෙයි හැම අස්සක් මුල්ලක් නෑර අපි ඇවිද බැලුවෙමු. සමහරු උඩ තට්ටුවට ගියහ. සමහරු බිම් මහලේ කෙළවර වූ කුස්සිය පැත්තට ගියහ.

උඩුමහලේ බොහෝ කාමරවල දොරවල් ඇර දමා තිබිණි. එහි ඇති බඩු භාණ්ඩ බොහෝය. ඇඳන් මත කළු ලොමෙන් වියූ ඇඳ රෙදි අතුරා තිබුණු අතර ඒ ඇඳ ඇතිරිවල ඉහ ඉද්දර රතු සන නූලෙන් අඟල් 18 ක් වත් දිගු කුරුසය බැගින් මසා තිබිණ.

වයස අවුරුදු 60 ක් වූ කාන්තාවක් පමණක් කුස්සියේ සිටියාය. රෙද්ද හැට්ටය ඇඳි ඇය ඉතා කරුණාවන්තය. එදා එහි කෑම කිසිවක් ඉවූ බවක් නොපෙනිණ. පැය කීපයක් ගත කළ අපි ගෙදර සිටි එකම තැනැත්තියට අප පිටවී යන බව කියා පිටත් වී ගියෙමු.

ආචාර්ය හරිස්චන්ද්‍ර විජයතුංග

හොරගොල්ලට ගියද එය පාළු ගෙයක් මෙන් පෙනුණ නමුත් මීට ඉහත අවස්ථාවලදී බණ්ඩාරනායක මහතා ගේ කොළඹ රොස්මිඩ් පෙදෙසේ තිබෙන ගෙදරට කීපවතාවක් ගොස් ඇත්තෙමු. එය අප යන හැම වෙලාවේම සෙනඟ පිරී කාර්ය බහුල තැනක් බවට පෙනුණේය. එහි දී ඔහු මුණගැසීමට පවා අපට අමාරු විය.

හදිසියේ පාර්ලිමේන්තුව විසිරුවා හැරීම නිසා සියලුම දේශපාලන පක්ෂ අමාරුවට පත් වුණා යැයි කීමට පුළුවන. එය විශේෂයෙන් බලපෑවේ විපක්ෂයටය. එයිනුත් ශ්‍රී ලංනිපයට ය. මේ වන විට ල. ස. ස. ප. හා කො. ප. දෙක එකතු වී ශ්‍රී. ල. නි. ප. සමඟ නිතරග ගිවිසුමක් ගසාගෙන තිබිණි.

පිලිප් ගුණවර්ධන මහතා ගේ නායකත්වයෙන් පැවති විප්ලවකාරී සමසමාජ පක්ෂයද, ඩබ්ලිව්. දහනායක, කේ. ඇම්. පී. රාජරත්න, සෝමවීර චන්ද්‍රසිරි, ඒ. ඊ. ගුණසිංහ, අයි. ඇම්. ආර්. ඒ. ඊ. ඊරියගොල්ල යන පුද්ගලයන්ට සම්බන්ධ සංවිධාන ද ස්වාධීන කීපදෙනෙක්ද එකතු වී මහජන එක්සත් පෙරමුණ නමින් සංවිධානයක් 1956 පෙබරවාරියේදී හදිසියේ පිහිටුවා ගන්නා ලදී. පොදුවේ ගත් කළ මහජන එක්සත් පෙරමුණ "සිංහල පමණක්" පිළිගත් සංවිධානයකි. එය සමතැනට විරුද්ධය. එහෙත් සමතැන්වාදීහු නිතරග ගිවිසුම යටතේ එමින් මේ පිලේ සිටියහ. මේ හේතුකොටගෙන එය එ. ජා. ප. ආණ්ඩුවට එරෙහි වූ විශාල ජන වේගයක් බවට පත් විය. මීටම සංඝයා වහන්සේලාගේ සංවිධාන කීපයක් පූජ්‍ය හේන්පිටගෙදර ඤාණසීහ හිමි, පූජ්‍ය බද්දේගම විමලවංශ යන ස්වාමීන් වහන්සේලා ප්‍රධාන කොටගෙන විද්‍යාලංකාර මහ පිරිවෙන් හා විද්‍යෝදය මහ පිරිවෙනේ ස්වාමීන් වහන්සේලාද සමග සහයෝගයට ආහ. රටපුරා විසිරී සිටි ආයුර්වේද වෛද්‍යවරු ද සංවිධානගතව පෙළ ගැසී ආහ. ජාතික ගුරු සංගමය, රජයේ ගුරු සංගමය ආදී ගුරු සංගම්ද පෙරමුණේ පැමිණියේය. මෙහි දී ඒ. ජී. ජයසේකර, දේ. පීටර් සිල්වා, ල. මෙත්තානන්ද ආදීන්ගේ සේවාව ඉතා විශාලය. මීටම ගොවි සමිති හා කම්කරු සමිතිද එකතු විය. මේ හේතුකොටගෙන "සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු" යන එකතුව පහළ විය. මේ අන්දමට විශාල පිරිසක් ඒකරාශි වූ අතර "ලෝකයේ කම්කරුවනි එක්වවු" කියා එකතු කරගත නුහුණු දැවැන්ත පිරිසක් "සිංහල රාජ්‍ය භාෂාව කරමු" යැයි කී විට එකතු විය. මෙය දේශවාත්ශල්‍යය ලත් ජයකි.

2550 බුද්ධ වර්ෂය පිරීම අරභයා රටේ විශාල ආන්දෝලනයක් ගෙන යමින් සාක්ෂි රැස් කරමින් තිබුණු සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බෞද්ධ තොරතුරු පරීක්ෂක කොමිසම කඩිමුඩියේ තම වාර්තාව ලියා මුද්‍රණය කොට නිකුත් කළේය. එය බෞද්ධ කොමිෂන් සභා වාර්තාව නමින් ප්‍රසිද්ධිය. මෙය ජනතා අපේක්ෂා ලිඛිතව ඉදිරිපත් මහා ලේඛනයකි.

ලංකාදීප පත්‍රයේ මෙහෙයීමෙන් කිව්සුරු රැපියෙල් තෙන්නකෝන් මහතා ලවා ලියෙවූ පැදි 2500 කින් යුක්ත "සිංහල වංසය" නමැති පොත ද මේ අවධියේ දීම මුද්‍රණයෙන් පළ විය.

වර්ෂ ගණනාවක් තිස්සේ සිංහල - බෞද්ධ ජන නායකයන් තම ධනයත් ශ්‍රමයත් කැප කරමින් දිවා රෑ නොබලා වෙහෙසී උද කිරීමට වෙර දැරූ පුනරුදය මේ අන්දමින් අන්තිමේ කුළු ගැන්වී පැමිණ මහමැතිවරණයකට මුණදීම පිණිස පේවී සිටියේය. මෙතෙක් කියවුණේ එක් පිලක කථාවෙන් සුළු කොටසක් පමණි.